# ඩී එල් අමරසිංහ එ ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

RTIC Appeal (පුද්ගලික වශයෙන් විභාග කිරීම)/951/2019 (2019.05.07 දින පැවති විධිමත් කොමිෂන් සභා රැස්වීමේදී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය).

2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි (ගාස්තු හා අභියාචන කාර්යය පටිපාටිය), රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යය පටිපාටිය.

**කොමිෂන් සභා සමාජික:** ජොෂ්ඨ නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන
**කොමිෂන් සභා සමාජික:** ජොෂ්ඨ නීතිඥ එස්. ජී. පුංචිහේවා
**කොමිෂන් සභා සමාජික:** විනිසුරු රෝහිණී වල්ගම

**අභියාචක** - ඩී එල් අමරසිංහ
**නොතිසි ලත් පාර්ශවය** - නම්කළ නිලධාරි, ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

**පෙනීසිටීම**

අභියාචක - ඩී එල් අමරසිංහ
පොදු අධිකාරිය - දිලුමි වික්‍රමාරච්චි - නෛතික සහයිකා
ප්‍රීතිකා සකලසූරිය - සහය අධ්‍යක්ෂිකා, නෛතික

| | |
|---|---|
| තොරතුරු ඉල්ලීම ගොනු කරන ලද දිනය | 2018.10.17 |
| තොරතුරු නිළධරයා තීරණය ලබා දුන් දිනය | ප්‍රතිචාරයක් නොමැත |
| නම් කල නිළධරයා වෙත අභියාචනය යොමු කළ දිනය | 2018.11.05 |
| නම් කල නිළධරයා තීරණය ලබා දුන් දිනය | ප්‍රතිචාරයක් නොමැත |
| තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව වෙත අභියාචනය යොමුකළ දිනය | 2018.12.05 |

**අභියාචනයට පසුබිම්වූ කරුණු:**

අභියාචක 2018.10.17 දිනැති තොරතුරු ඉල්ලීම මගින් පහත තොරතුරු ඉල්ලා සිටින ලදී.

1. *CA/01/14/10/8909 පැමිණිල්ලට අදාළ ලිපිගොනුවේ සියලු ලිපිලේඛනවල සහතික කරන ලද සත්‍ය පිටපත් මා වෙත ලබාදෙන්න.*

2. *එම පැමිණිල්ල පිළිබඳව රත්නපුර ප්‍රාදේශීය ලේකම් වෙනුවෙන් එම රාජකාරිය ඉටුකළ නිලධාරිතුමියගේ සටහන් සහ ඒ නිලධාරිතුමියගේ*

*වාර්තාව පිළිබඳව ඔබ ආයතනයේ ඇති ලිපි ලේඛනවල සත්‍ය පිටපත් ලබාදෙන්න.*

3. *එම ඉහත පැමිණිල්ල පිළිබඳව ඔබ අධිකාරිය විසින් සිදුකලාවූ නිර්දේශ, නියමයන් හෝ නියෝග මොනවාද? තොරතුරු ලබාදෙන්න.*
4. *දරුවාට පැහැදිලිවම හිංසනයක් සිදුවූ බව අධිකාරිය පිළිගන්නවාද?*
5. *දරුවාට හිංසනය සිදු වූ ආකාරය කොහොමද?*
6. *මෙම වගඋත්තරකරුවන් එක්සත් ජාතීන්ගේ ළමා ආරක්ෂණ පිළිබඳ ඇති පනත උල්ලංඝණය කර ඇත්ද? ඒ පිළිබඳ තොරතුරු ලබාදෙන්න.*

තොරතුරු නිලධාරියා පනත ප්‍රකාරව නියමිත කාලය තුළ, පිළිතුරු සැපයීමට අපොහොසත් වූ බැවින් අභියාචක 2018.11.05 දිනැතිව නම්කළ නිලධරයා වෙත අභියාචනයක් යොමු කරන ලදී. නම්කළ නිලධාරයාද පනත ප්‍රකාරව නියමිත කාලය තුළ ප්‍රතිචාර දැක්වීමට අපොහොසත් වූ බැවින් අභියාචක 2018.12.05 දිනැතිව කොමිෂන් සභාව වෙත අභියාචනයක් යොමු කරන ලදී.

**අභියාචනය සලකා බලන අවස්ථාවේදී උද්ගතවූ කාරණා:**

පොදු අධිකාරිය කරුණු දක්වමින් පවසා සිටියේ අභියාචක ඉල්ලා සිටි තොරතුරු වල පැහැදිලි පිටපතක් තමාට නොලැබුණු බවත්, තොරතුරු කොමිෂන් සභාවට දැන්වීමෙන් අනුතුරුව ඉල්ලා සිටි තොරතුරු වල පැහැදිලි පිටපතක් තම අධිකාරියට ලැබුනු බවයි.

එහෙයින්, ඉල්ලා සිටි තොරතුරු ලබාදීමේ හැකියාව හෝ නොහැකියාව පිළිබඳව ලිඛිත දේශනයක් මගින් කොමිෂන් සභාව දැනුවත් කිරීමට කාලයක් ලබාදෙන ලෙසට පොදු අධිකාරිය කොමිෂන් සභාවෙන් ඉල්ලා සිටින ලදී.

**නියෝගය:**

අභියාචක විසින් ඉල්ලා සිටි තොරතුරු ලබාදීමෙ හෝ නොදීමේ හැකියාව පිළිබඳව කොමිෂන් සභාව දැන්වීම සඳහා 2019.08.13 දින හෝ ඊට ප්‍රථම ලිඛිත දේශනයක් ඉදිරිපත් කිරීමට පොදු අධිකාරියට නියෝග කරනු ලැබේ.

කොමිෂන් සභා රීතින්හි, රීති අංක 27 (ගාස්තු හා අභියාචනා කාර්යපටිපාටිය, ගැසට් අංක 2004/66, 2017.02.03) ප්‍රකාරව මෙම නියෝගය දෙපාර්ශවය වෙත සන්නිවේදනය කරනු ලැබේ.

අභියාචනය කල් තබනු ලැබේ.

මීළඟ කැඳවීම් දිනය: 2019.08.13

---

RTIC Appeal (පුද්ගලික වශයෙන් විභාග කිරීම)/951/2019 (2019.08.13 දින පැවති විධිමත් කොමිෂන් සභා රැස්වීමේදී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය).

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි (ගාස්තු හා අභියාචන කාර්යය පටිපාටිය)**,** රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යය පටිපාටිය.

**සභාපති:** මහින්ද ගම්මම්පිල
**කොමිෂන් සභා සමාජික:** ජොෂ්ඨ නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන
**කොමිෂන් සභා සමාජික:** ජොෂ්ඨ නීතිඥ එස්. ජී. පුංචිහේවා
**කොමිෂන් සභා සමාජික:** විනිසුරු රෝහිණී වල්ගම

**පෙනීසිටීම**

අභියාචක - පැමිණ නැත
පොදු අධිකාරිය - ප්‍රීතිකා සකලසූරිය - සහය අධ්‍යාක්ෂිකා, නෛතික - ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

**අභියාචනය සලකා බලන අවස්ථාවේදී උද්ගතවූ කාරණා:**

අභියාචක පැමිණ නැති අතර ඔහු විසින් 2019.08.12 දිනැති ලිපියෙන් පහත සඳහන් කරුණු කොමිෂන් සභාව වෙත දැනුම් දී ඇත.

1. *ඉහත අභියාචනා අංකයට හා දිනයට (අභියාචනා අංක 915/19 දරණ 2019.06.28 දින) අදාළ තොරතුරු ජාතික ළමා ආරක්ෂණ අධිකාරිය වෙතින් මා වෙත ලබා දුන් බව දැන්වීමට කැමැත්තෙමි.*

2. *2019.08.09 දින පස්වරු 03.00 ට පමණ එම තොරතුරු මා වෙත ලැබුණු අතර ජාතික ළමා ආරක්ෂණ අධිකාරිය විසින් නියමිත පරිදි තොරතුරු මා වෙත ඒවා තිබුනත්, තැපැල් සේවකයන්ගේ වර්ජනයක් නිසා එම ලිපි ප්‍රමාද වී ලැබුණු බව ලියුම්කරු මාගේ නිවසට දන්වා ඇත.*

3. *තොරතුරු කොමිසම අභියාචනා විභාගය සඳහා 2019.08.13 දින අපව කැඳවා තිබුනද, මාගේ දකුණු පාදයේ සිදුවී ඇති අනතුරක් නිසා පැමිණීමට අපහසු වී ඇත.*

4. *මා ඉල්ලා සිටින ලද තොරතුරු වල අනුපිළිවෙලෙහි කුඩා ගැටළුවක් ඇති අතර එය මා හට ගැටළුවක් නොවේ. මින් ඉදිරියට පුරවැසියන් ඉල්ලා සිටින තොරතුරු නියමිත පරිදි ලබා දීමට කටයුතු කරන්නේ නම් ළමා ආරක්ෂණ අධිකාරියට ස්තුතිවන්ත වෙමි.*

5. *ලබා දුන් තොරතුරු අනුව මාගේ දරුවාට හිංසනයක් සිදු වී ඇති බව මාගේ විශ්වාසයයි.*

6. *තොරතුරු ලබාගැනීමට ඔබ තොරතුරු කොමිසමට ලබා දුන් සහයෝගය ඉතා අගය කොට සලකමි.*

7. *මෙම ලිපිය ලැබීමෙන් පසු මෙම අභියාචනා විභාගය අවසන් කල හැකි බව මාගේ විශ්වාසයයි.*

8. *මෙම ලිපිය ලියාපදිංචි තැපෑලෙන් ලබා දීමට කටයුතු කරමි.*

9. *ඉහත කාරණා කෙරෙහි ඔබගේ අවධානය යොමු කරන මෙන් ඉතා කාරුණිකව ඉල්ලා සිටිමි.*

ඉහත කරුණු වලින් ලිපියෙන් දක්වා ඇති ආකාරයට අභියාචකට තොරතුරු ඉල්ලීම මඟින් ඉල්ලා සිටි තොරතුරු සියල්ල ලැබී ඇති බව තහවුරු වේ.

**නියෝගය:**

අභියාචකට ඉල්ලීම් කල තොරතුරු පොදු අධිකාරිය විසින් සපයා ඇති බැවින් මෙම අභියාචනයේ කටයුතු අවසන් කරනු ලැබේ.

අභියාචනයේ කටයුතු මෙයින් අවසන් කරන ලදී.

කොමිෂන් සභා රීතින්හි, රීති අංක 27 (ගාස්තු හා අභියාචනා කාර්යපටිපාටිය, ගැසට් අංක 2004/66, 2017.02.03) ප්‍රකාරව මෙම නියෝගය දෙපාර්ශවය වෙත සන්නිවේදනය කරනු ලැබේ.
*******